





46 වන පිටෙන්

නැහැ. සිතට හරි ම සුවයක් පහසුවක් මෙහි දී දැනෙන්නේ. ශරීරය සිතට පෙනෙන විට ඒක දුකක්. මේ නිසා දැන් මෙතැන දී තේරුම් ගන්නට ඕනෑ මේ ශරීරය දුක්ඛ සත්‍යයක් ය කියලා. ශරීරය ස්වභාවයෙන් ම දුක්ඛ සත්‍යයක්. මොක ද ජරාවට පත් වනවා, ව්‍යාධි එනවා, මරණ දුක් ගෙන දෙනවා. සා පිපාසා දුක් දුක් ඇති වෙනවා. මැසි මදුරු උවදුරු, අමනුෂ්‍ය උවදුරු ආදී විවිධ දුක් ඇති වෙනවා. ශරීරය මොන ඉරියව්වෙන් තබාගෙන හිටියත් ටික වේලාවක් යන විට ඇති වෙන්නේ දුකක්. අපි හිතමු ශරීරය නිසල ව සන්සුන් ව විවේකයෙන් සැහැල්ලුවෙන් කිසිම ආකාරයක දුකක් නැති ව සුව සේ නිදාගෙන මෙන් තබාගෙන සිටිනවා. එහෙම ඉන්න කොට තමන්ට සිතෙනවා දැන් හොඳ සුව පහසු විධියට නිදාගෙන සිටින්නේ. දැන් කිසි ම දුකක් ශරීරයෙන් ලැබෙන්නේ නැහැ කියලා. ඒ ශරීරය පවා දුකක් කියලා දකින්නට ඕනෑ. මොකද, තමන්ගේ රූපය සිතට පෙනි පෙනී තිබෙන විට දැනුණ තත්වයයි, සිතට ශරීරය සම්පූර්ණයෙන් ම නොපෙනී ගියාට පසුව තිබෙන නිවුණ ශාන්ත ස්වරූපයයි අතර විශාල වෙනසක් තිබෙනවා. මේ ශරීරයේ පැවැත්ම දුකක් ය කියලා මේ ආකාරයෙන් ශරීරය දුක්ඛ සත්‍යය වශයෙන් දකින්න.

මේ වගේ ම මේ ශරීරය නිසා විවිධාකාර දුක් ලබා දෙනවා. ඒක නිසා මේ ශරීරය දුක්ඛ සමුදය සත්‍යයක් කියලා දකින්න.

දැන් අපි මේ ශරීරය දුක්ඛ සත්‍යය කියලා දැක්කා, දුක්ඛ සමුදය සත්‍යය කියලා දැක්කා, මේවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතු කියලා, මේවා අනිත්‍ය යි දුක්ඛ යි අනාත්ම යි කියලා අවබෝධ වන විට තමන්ගේ පංචස්කන්ධ ධර්ම යි ක්‍රියාත්මක වුණ්. සිතේ ක්‍රියාදාමයක් තිබුණා. කයේ පැවැත්මක් තිබුණා. මේ නාම රූප ධර්ම තිබෙන එක ම දුකක්. ඒක නිසා මාර්ග සත්‍යයත්, දුක්ඛ සත්‍යයක් ම වෙනවා. මෙන්න මේ සත්‍ය තුන තේරුම් ගන්න. රූපස්කන්ධය තුළ පවත්නා වූ දුක්ඛ සමුදය සත්‍යයයි. සමුදය සත්‍යය යි. ඒක දක්නා මාර්ග සත්‍යය යි, ඒ මාර්ග සත්‍යය ම දුක්ඛ සත්‍යයක් බවට පත් වන ආකාරයයි දකින්න. එතකොට රූපස්කන්ධය පිළිබඳව පවත්නා දුක්ඛ සත්‍යය තරමක් දුරට හෝ අවබෝධ කරගන්නට පුළුවන් වේවි.

මේ අවබෝධය ඇති කරගෙන, නැවත රූපස්කන්ධයේ ධාතු හතර සිතින් අයින් කොට අත්දැකිය හැකි ශූන්‍යතාවයට සිත පත් කරගන්න. මෙහි දීරූපය සිතට නොපෙනී නිවී ගොස් තිබෙන නිසා, තමාගේ ආත්මය යැ යි ගැනීමට කිසි දෙයක් රූපය තුළ නැති බව අත්දකින්න. රූපය ආත්මයක් නොවෙයි.

දැන් අත්දකින්නා හිස් භාවයක් හා එය දැනෙන දැනීමක් හැර වෙන කිසිවක් ආත්මයක් කියා ගැනීමට ඉතිරි වී නැහැ. මේකත් නිත්‍ය නො වෙයි. අනිත්‍ය යි. අනිත්‍යයට ගියාටප ස්සේ ඒකෙන් ආත්මයක් කියලා ගන්නට මොනවත් ඉතිරි වන්නේ නැහැ. මේ අවබෝධය ඇති කරගෙන, ඒ හිස් භාවයේ සිටිත් දී ම මෙයත් අනිත්‍ය වූ සංස්කාරයක්, අනාත්ම වූ සංස්කාර ධර්මයක්, මෙයත් මම හෝ මගේ ආත්මයක් නො වෙයි කියා දකින්න. එවිට ඇති වන ඊට වඩා සියුම් නිවී යෑම පවා අනිත්‍ය හා අනාත්ම බව අවබෝධ වුවහොත්, ඒ නාම ධර්මයත් ක්ෂණයක දී නිවී යනවා දැකීමට සමහර විට හැකි වේවි. කළින් දුටු රූපයේ නිවී යෑමත් මේ නාමයේ නිවී යෑමත්, මේ නාම රූප ධර්මයන්ගේ නිවී යෑමත් දකින විට, ආත්මය, කියා ගැනීමට කිසිවක් නැති බව අවබෝධ වී, නාම රූප නිරෝධයක් අත්දැක, නිවනට සිත පත් කර ගැනීමට පාරමී ශක්තියක් ඇති කෙනෙකුට මෙහි දී සමහර විට පුළුවන් වේවි.

# වාසනාවන්තයෝ

නවීන පන්නයේ මෝටර් රිය කීපයක් ම හිමි ප්‍රභූ කාන්තාවක් ඉරිදා වෙළඳපොළට පා ගමනින් ම යන්නී රුධිය පීඩනයෙන් කය රැකගැනීමට ය.

ඇය කැටුව ඇගේ සේවිකාව ද යයි.

එදින ප්‍රභූ කාන්තාවගේ මුහුණ මැළවී තිබිණ.

''බලාපන් ලිසී, අපේ බේබිලාට වෙච්ච දේ, කෑම කවා ගන්න බෑ. පොඩි බේබිට බටර් පාන් පෙත්තක් කවා ගන්න අද උදේ මම ගත්ත මහන්සිය ලිසීත් දැක්ක නේ.''

මෙහෙකාරියට සිය ස්වාමි දුන ගැන දුකක් ඇති විය. එහෙත් පිළිතුරක් නුදුන්නා ය. ඇයට සිතන්නට වෙනත් දෙයක් තිබිණි. ඒ ඇගේ කුසට ප්‍රමාණවත් ආහාරයක් නොලැබීම ගැන ය.

ප්‍රභූ කාන්තාවට පා ගමන වෙහෙසකර ය. මඳක් නැවතුණා ය. ඉඟටියට දෑත තබාගෙන හති හැලුවා ය.

මග අයිනේ කුණු ගොඩක පොර අල්ලන ළමයින් කීප දෙනෙකු දෙසට ඇගේ දෑස ගියේ ය.

''ආන්න - ආන්න බලාපන් ලිසී. අර කපුටො වගේ කොල්ලො ටික කවුද විසිකළ කෑම පැකට් එකකට පොර කනවා.''

උන්ට කොපමණ කැම තිබුණත් මදිව ඇති. අපේ ගෙදර කොහොමද? අපේ ළමයි හරිම අවාසනාවන්තයි ලිසී...''

තදින් ම හුස්ම ඉහළ පහළ දමමින් ප්‍රභූවරිය කීවා ය.

ඇගේ මුහුණේ ශෝකාකූල පෙනුම වැඩි විය. ''ඔව් නෝනා - මේ ළමයි නම් හරිම වාසනාවන්තයි'' ලිසී කීවා ය.